## “මළවුන් ගෙන්වීම පිළිබඳ රසවත් අත්දැකීමක්”

**හේතුවාදී ගවේෂණ ඇතුලත් සිංහලයෙන් ලියැවුණු ප්‍රථම කෘතිය මාධ්‍යවේදී තිලක් සේනාසිංහ ලියූ ‘ජනකාන්ත මිථ්‍යා මත’ ග්‍රන්ථයයි. 2001 වසරේ මුල්වරට එළි දැක්වුණු මෙම කෘතියේ තුන්වැනි මුද්‍රණය වසර එකොලහකට පසු යාවත්කාලීන සංස්කරණයක් ලෙසින් 2011 අගෝස්තු 21 අඟහරුවා ද ප.ව. 3.30 ට කොළඹ 07, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ මහජන පුස්තකාලීය ශ්‍රවණාගාරයේ දී එළි දක්වීමට නියමිතය. මෙහි දැක්වෙනුයේ ‘ජනකාන්ත මිථ්‍යා මත’ ග්‍රන්ථයෙන් උපුටා ගැනුණු කතුවරයා ගේ හේතුවාදී ගවේෂණ සම්බන්ධ රසවත් අත්දැකීමකි.**

**□□□□□□□**

එය කිරිගහට ඇන්නාක් මෙන් මළවුන් ගෙන්වා තමන්ට ඇවැසි දේ දැනගත හැකි ස්ථානයක් බව මට මුලින්ම කීයේ විශ්‍රාමික විදුහල්පතිනියකි. ඉන්පසුව ද ඒ ස්ථානය පිළිබඳව විස්තර කළ බොහෝ දෙනකු කීයේ එය කිසිදු හොරයක් බොරුවක් නොකරන තැනක් බවය.

ඒ අවට මම 2010 ජූලි 10 සඳුදා මධ්‍යාහ්නයේ මුල්වරට දෙම්පේ පිහිටි එම ස්ථානය වෙත ගියෙමි. මෙම භූමියෙහි බෝධියක් සහ අටවිසි බුදුරුවන්ගේ ප්‍රතිමා සහිත කුඩා බුදු මැදුරක් ද තිබිණ. ඊට යාබද දේවාලයේ සුදු බිත්තියෙහි ඇඳි පත්තිනි දේවියගේ රුවක් එහි යන කාටත් දැක ගත හැකි විය.

“මම ආවෙ මළවුන් ගෙන්වලා ශාස්ත්‍රයක් අහන්න.”

එහි දේවාලයේ ඉදිරිපස පිල්කඩ මත වාඩි වී සිටි තරුණයාට මම කීවෙමි. ඒ වන විටත් දේවාලය ඇතුළතින් කාන්තාවක ශාස්ත්‍ර කියන හඬක් නික්මුණු අතර ශාස්ත්‍ර ඇසීමට තමන්ගේ වාරය එන තෙක් තවත් හත් අට දෙනෙක් ගෙමිදුලෙහි වූහ.

“අද කරන්නේ සාමාන්‍ය විදිහට සාස්තර කියන එක. ඥතින් ගෙන්වන්නේ අඟහරුවාද , බ්‍රහස්පතින්දා, ඉරිද විතරයි. ඒ නිසා දැන් ගිහින් හෙට උදෙන්ම එන්න.” එම තරුණයා පහත් හඬින් මුමුණන ලද්දේ මළවුන් නිතර යන එන මෙවන් ස්ථානයක උස් හඬින් කතා කිරීම ද අයෝග්‍ය බව අඟවන්නාක් මෙනි.

“අනේ මම බොහොම දුර ඉඳන් ආවෙ. උදෙන්ම නම් එන්න විදිහක් නැහැ. දහයට විතර තමයි එන්න පුළුවන්.” මම කීවෙමි.

"එහෙම බැහැ. පාන්දර ඉඳලම තුණ්ඩු දෙනවා. උදේ නවයට තමයි දේවාලයේ වැඩ පටන් ගන්නේ. මුල්ම නොම්මරයක් වුවමනා නම් පාන්දර පහට වත් එන්න වෙනවා." හෙතෙම කීය.

"බැරිද මට මොකක් හරි උදව්වක් කරන්න. මාත් පොඩි සපෝට් එකක් දෙන්නම්."

මම ඔහුට අයථා බලපෑමක් කළෙමි.

"එහෙම බැහැනේ." ඔහු මඳ කල්පනාවක නිමග්න විණි.

"දුර පළාත් වලින් සාස්තර අහන්න එන අය අද රෑ ඇවිත් මෙහෙ නතර වෙනවා. එහෙම මෙහෙ නවතින්න බැරි නම් ඒ නවතින කාට හරි කියලා නොම්මරයක් වෙන් කර ගන්න. ගාස්තුව රුපියල් දෙසිය අටයි. බුලත් වලට දහයයි. රෑට ඇවිත් ඒ කාට හරි දෙසීය දහ අටක් දීලා යන්න."

ඔහු පවසන ලද්දේ එම දේවාලයට නුදුරින් වූ දෙර ජනෙල් හැර දමන ලද පැරණි නිවහනක් පෙන්වමිනි. එය දුර බැහැර සිට මළවුන් ගෙන්වීමට සහ ශාස්ත්‍ර ඇසීමට එන්නවුන්ගේ ලැගුම් පලක් බව මට වටහා ගත හැකි විය. ඒ අනුව එදින රාත්‍රී අටට පමණ නැවත එහි ඒමට මට සිදු විය. මහනුවර ප්‍රදේශයේ සිට පැමිණි බවක් කියා සිටි එක් වියපත් කාන්තාවක ඇතුළු තවත් කිහිප දෙනෙකු ඒ වන විට එහි ලැගුම් ගෙන සිටි අතර මම එම කාන්තාවට රුපියල් දෙසිය දහ අටක් දී මා වෙනුවෙන් ද පසුද මළවුන් ගෙන්වීම පිණිස නොම්මරයක් වෙන් කර ගන්නා මෙන් ඉල්ලා සිටියෙමි.

2000 ජූලි 11 වෙනි අඟහරුවාදා පෙරවරු නවයට මා එහි යන විට එම දේවාලය වටා පනහකට ළං වන පිරිසක් රොක් වී සිටියහ. ඔවුන්ගෙන් ඇතැමකු අධි සුඛෝපභෝගී වාහන වලින් පැමිණි බවත්, මට දැකිය හැකි විය.

පෙරවරු නවයට පමණ කලින් දින මට හමු වූ තරුණයාත් , තවත් තරුණයෙකුත් පැමිණ සක් පිඹීමෙන් සහ භේරි වාදනයකින් පසු දේවාලයේ තේවාව ඇරඹුහ.

රිදී පැහැති උපැස් යුවළක් පැළඳ සුදු පැහැයට හුරු දිගු සායකින් සහ බ්ලවුසයකින් සැරසී සිටි එම ජේනකාරිය මැදිවියේ කාන්තාවකි. රැස්ව සිටි කාගේත් ගෞරවයට පාත්‍ර වෙමින් දේවාලය වෙත පැමිණි ඇය තමන් විසින් ගෙනෙන ලද හඳුන්කූරු පැකට්ටුව බෝධිය දෙසට දිගු කොට "මේක පත්තු කරලා එන්න" යැයි කාටත් ඇසෙන සේ කියමින් ඉහත සඳහන් කළ තරුණයකුට දුන්නා ය. මළවුන් ගෙන්වීමට පෙර ඇගේ ආගමික වතාවත් එපමණක් විණි. අනතුරුව මඳ වේලාවක් දේවාලයෙහි ආලින්දයෙහි ගත කළ ඇය දෙවොල තුළට ගොස් ගත් කහ පැහැති වතුර බෝතලයකින් ස්වල්පයක් අත්ලට ගෙන කාටත් පෙනෙන සේ හිස ගල්වා ගැනීමෙන් මළවුන්ගේ ලෝකයට ගොස් ඔවුන් මෙහි කැඳවා ගෙන ඒමට අවශ්‍ය "පාරිශුද්ධත්වය"

ලැබුවා ය. ඒ සමග එක් තරුණයෙක් දේවාලය ඉදිරියේ පොල් ගෙඩියක් ද ගැසුවේය. මඳ වේලාවකට පසු එම පේනකාරිය දේවාලය තුළට පිවිසි අතර ඇය අමුතුම භාෂාවකින් මන්ත්‍ර ජප කරනු ඇසිණි. එම භාෂාව කුමක්ද යන්න මා තබා ඇයවත් නොදන්නා බව පැහැදිලි ය.

"නොම්බර එක එන්න."

ඒ වන විට දේවාලයේ තිර පට මෙපිටින් සිමෙන්ති පොළව මත වාඩි වී සිට එක් තරුණයෙක් කීය. ඔහු ඉදිරියේ පෝටබල් කැසට් රෙකෝඩරයක් තිබිණ. මෙහි පැමිණ ශාස්ත්‍ර අසන හෝ මළවුන් ගෙන්වන අයට අවශ්‍ය නම් එම අවස්ථාව ඔහු ලවා පටිගත කරවා ගත හැක. වෙළෙඳ පොළේ එවකට රුපියල් හැටක් තරම් කැසට් පටියක එය පටිගත කර දීමට රුපියල් එකසිය තිහක මුදලක් අය කරනු ලැබිණ. නමුත් එකී කටයුත්ත සඳහා කල් ඇතිවම සූදනම් කරගත් මිනි වොයිස් රෙකෝඩරයක් ඒ වන විටත් රහසිගත ව මගේ කමිස සාක්කුවේ තිබූ බැවින් මට එම මුදල බේරා ගත හැකි විය.

"නොම්මර දෙක එන්න"

මහනුවර සිට පැමිණ පෙරදා රාත්‍රියේ මෙහි පළමුවෙන් ලැගුම් ගත් කාන්තාව මළවුන් හා කතා කොට දෙවොලෙන් පිටතට එද්දී ඊළඟට මගේ අංකය කැඳවන ලදී. එවිට දැකිය හැකි වූයේ මට පෙර මළවුන් ගෙන් වූ කාන්තාවගේ මුහුණ කඳුළින් නැහැවී ඇති අන්දම ය. තමන් වියෝ දුකකට පත් කොට සදහටම වෙන්ව ගිය ඥතියා සමග යළි මෙලෙස කතා බහකට පිවිසීමට හැකි වීම ඇයට අතිශය භාවාතිශය අත්දැකීමක් වූවාට සැක නැත.

"වැඳගෙන මිය ගිය ඥතියෙකුව හිතා ගන්න." යැයි දෙවොලෙහි තිර පට තුළින් ගැහැනු හඬක් ඇසිණි. එහෙත් එම පේනකාරිය මට නොපෙනිණ. අනතුරුව ඇය "මළවුන්ගේ භාෂාවෙන්" ඔවුන් කැඳවනු ඇසිණ. ගත වූයේ විනාඩියක පමණ කෙටි කාලයකි.

"මව් පාර්ශ්වයේ සහ පිය පාර්ශ්වයේ ප්‍රාණ දෙකක් පෙන්නුම් කරනවා දරුවා" තිරයෙන් එපිට සිට යළි ඕ කීවාය.

ඉන් මඳ නිහැඬියාවකට පසු මහළු කාන්තා හඬක් නැගුණි.

"පුතේ ඔයා කොහෙද මෙහේ?" යනුවෙන් එම හඬ ම ' වෙතින් විමසන ලද්දේ මා අන්දමන්ද කරවමිනි. එවකට මගේ මව් පාර්ශ්වයෙන් මට මතක ඇති කාලයක කිසිවෙක් මිය ගොස් නැත.

"දැන් අහන්න තියෙන දෙයක් අහන්න"

පටිගත කිරීම් භාරව දෙවොලේ තිරකඩට මෙපිටින් හිඳින තරුණයා රහසින් මිමිණුවේය.

"ඔය පුංචි අම්මා නේද?" මම රහසින් මිමිණුවෙමි.

"අනේ ඔව් මගෙ පුතේ ! මං පුංචි අම්මා තමයි." එකෙනෙහිම මහළු හඬක් ආරෝපණය කර ගත් ශාස්ත්‍ර කාරිය තිරයෙන් එපිට සිට හඬ නැගුවා ය. "අනේ ඇයි පුතේ මෙහෙ ආවේ? පුතාටත් දැන් හරිම ප්‍රශ්න නේද? මට හැම දෙයක්ම පේනවා මගේ පුතේ."

එලොව සිට පැමිණි "පුංචි අම්මා" වක්කඩ කැඩුවාක් මෙන් එක දිගටම කතා කරනු ඇසෙයි.

එහෙත්, මට එලෙස ගෙන්වීමට සුළු මවක නැත. ඒ මගේ මව ඇගේ පවුලේ බාල දියණිය බැවිනි. එසේම පිය පාර්ශ්වයෙන් සුළු පියකු ද මට නොසිටි නිසා ඒ ඔස්සේ වත් සුළු මවක මට ලැබී නොතිබිණි. එබැවින් මා පේනකාරිය හමුවට ගෙනෙන ලද්දේ හුදු මනඃකල්පිත චරිතයකි.

"පුංචි අම්මා මහරගම ඉස්පිරිතාලෙ ඉන්න කොට මට බලන්න එන්න බැරි වුණා. අනේ මට සමාවෙන්න පුංචි අම්මේ."

මම ද වේදනාත්මක ස්වරයෙන් කෙදිරි ගෑවෙමි.

"අනේ පුතේ මං පිළිකා රෝගයක් හැදිලා දුක් වින්දා, මගේ පුතේ.......අනේ මටත් සිද්ද වුණු දෙයක්."

මා පේනකාරියට එල්ල කළ පළමු පන්දුවෙන්ම ඇගේ කඩුල්ල පහසුවෙන් බිඳ වැටීම පිළිබඳව මම යටි සිතින් සතුටු වීමි.

"ඉතින් දැන් පුතා මොනවද කරන්න හිතාගෙන ඉන්නෙ?" පුංචි අම්මා මගෙන් ඇසුවා ය. ඒ ම'වෙතින්ම යමක් දනගනු පිණිස බවට සැක නැත.

"මම බස් දෙකම විකුණලා දැම්මා පුංචි අම්මේ, තියාගෙන වැඩක් නැහැ."

මම දෙවන 'දඟ පන්දුව' ද ඇය වෙත එල්ල කළෙමි. දිවි ඇති තුරාවට බස් හිමියකු වීමේ අභිලාෂයක් මා තුළ නැත. අඩුම ගණනේ අපේ හත්මුතු පරම්පරාවේවත් බස් මුදලාලි ලා නොමැත.

"අනේ, ඔව් පුතේ! ඒක හොඳයි. උන් පුතාට ඕක කරන්න ඉඩ දෙන්නෙ නෑ. වෙන මොකුත් නෙමෙයි පුතේ ඉරිසියාව........ඉරිසියාව.........මට නොදන්නවැ ඕකුන්ගෙ හැටි. මොනව වුණත් පුතාට මං ඉන්නවා මගේ පුතේ."

පරලොව සිට පැමිණි මගේ "නූපන් පුංචි අම්මා" තුළ මා පිළිබඳ මහත් සෙනෙහසක් ඇති සේ ය.

"ලොකු මස්සිනා තැන් තැන් වල කියලා තියෙනවා පුංචි අම්මේ, මට මේ හැම දෙයක්ම වෙලා තියෙන්නේ පුංචි අම්මාගේ ශාපය නිසාලු. ඉස්සර පුංචි අම්මා මට ශාප කළාලු. මට දැන් හැමදම පුංචි අම්මව එක එක විදිහට හීනෙන් පේනවා පුංචි අම්මේ." ඒ ආශ්වාදය සිත තුළ සඟවා ගත් මම අන්ත අසරණ ස්වරයෙන් කෙදිරීමි.

"අනේ මගේ පුතේ බොරු, අමූලික බොරු, මං ඔය කේන්තියට කෑ ගැහුවට පුතත් එක්ක තරහ නැහැ. මගේ පුතේ . ඒත් ඕකා නම් දැන් පුතාට බන්ධනයක් කරලා තියෙන්නේ. ........ ඒකයි පුතාට දැන් වගතුවක් නැත්තෙ. පුතා දැන් නිතරම ලෙඩ ගාණෙත් නේද?"

පුංචි අම්මා දැන් 'ඕකා' යනුවෙන් හඳුන්වන්නේ මා හඳුන්වා දුන් "කල්පිත ලොකු මස්සිනා" විය යුතු ය.

"පුංචි අම්මා දැන් කොහෙද ඉන්නේ?" අනතුරුව මම ඇසීමි.

"අනේ මගෙ පුතේ මං දැන් පෙරේතියක්. මළ පෙරේතියක් !!" පේනකාරිය යළි හඬ උස් කොට කෑ ගසනුයේ තමන්ගේ මළවුන් ගෙන්වීමෙහි සත්‍යතාවය ඊළඟට පැමිණෙන ගනුදෙනු කරුවන් හට අනියම් ලෙස සංනිවේදනය කරවනු පිණිස ය. එවිට ඔවුන්ගේ සිත් තුළ ඇති ව්‍යංගයන් ද පහසුවෙන් පිබිදෙන බව ඇය දනියි.

"එහෙම නම් මං පුංචි අම්මා වෙනුවෙන් සාංඝික දනයක් දෙන්නද?" අනතුරුව මම ඇගෙන් ඇසීමි.

"කෙහෙල්මල් සාංඝික දන මට එපා. ඇයි කලිනුත් ගෙදර ඔය මොකක්ද කෙහෙම්මලක් කළා නේද? මං මළ පෙරේතියක් පුතේ. මට දන එපා" මගේ නූපන් පුංචි අම්මා කෝපයෙන් කෑ ගැසුවා ය.

බෞද්ධ පවුල් වල මිය ගියවුන් උදෙසා හත් දවසේ සහ තුන් මාසේ දන මාන පිරිනැමීම සාමාන්‍ය දෙයකි. "කලිනුත් මොකක්ද කෙහෙම්මලක් කළා නේද?" යනුවෙන් පේනකාරිය අසන ලද්දේ ඒ හෝඩුවාව ඔස්සේ බව මට රහසක් නොවිණි.

මගේ කල්පිත ලොකු මස්සිනා විසින් කරන ලද හූනියම ඉවත් කර ගෙන දැනට මළ ප්‍රේතියකව හිඳින තමන් ඒ දුගතියෙන් මුදවා ගන්නා ලෙස ඉල්ලා සිටි නූපන් පුංචි අම්මාගේ කටහඬ එක්වරම ගිලී යන ලද්දේ ඇය යළිත් ප්‍රේත ලෝකයට ම තල්ලු වී ගිය බව අඟවමිනි.

රුපියල් දෙසිය දහ අටකට බෙහෙවින්ම සෑහෙන එම හාස්‍ය ජනක අත්දැකීමක් විඳගත් මම ප්‍රේත පුංචි අම්මාගෙන් සමුගෙන ආපසු හැරෙත්ම මා අද්දර සිටි පටි ගත කරන 'නිලමේ' ගෙන් මැෂින් බස් ටිකට්ටු තුනක් පමණ වන කුඩා තුණ්ඩුවක් ම වෙත ලැබිණ. එහි මෙසේ සඳහන් විය.

"පිළිකා රෝගයෙන් මළ පුංචි අම්මාට පහන් පූජාවක් තබා පින් දෙන්න."

නැවත දිනක් මළ ගිය ප්‍රාණකාරිය ගෙන්වා ඇඳීමට වස්ත්‍රයක් දෙන්න."

ඒ සමඟම මගේ ශරීරයට සිදු කොට ඇති බන්ධන දෝෂය කපා ගන්නා අන්දමද එහි සවිස්තරව දක්වා තිබිණ. ඒ සඳහා නානාවිධ පූජා භාණ්ඩ කන්දරාවක් සමග රුපියල් තුන් දහස් පන්සිය හැටක මුදලක් ද රැගෙන සෙනසුරාදා හෝ බදාදා දිනෙක නැවත මා දෙම්පේ යා යුතුය.

එමෙන්ම දෙම්පේ පේනකාරිය පැවසූ අන්දමට මට මළ ප්‍රේතිය නැවත ගෙන්වා ඇයට ඇඳුමක් ප්‍රදනය කළ හැකි නම් සඳහා සුප්‍රසිද්ධ වෙළෙඳ නමකින් යුතු ඇඳුම් විලාසිතා කට්ටලයක් යොද ගැනීමට මට පුළුවන. එමෙන්ම ඒ සඳහා එම ආයතනයට මුදල් ගෙවීමට මට අවශ්‍ය නොවන අතර ඇතැම් විට කාරණය නිසි ලෙස පැහැදිලි කළහොත් එම ආයතනයෙන් ලොකු මුදලක් හිමි කර ගැනීමට ද මට හැකිවනු ඇත. ඒ ජාත්‍යන්තර වෙළෙඳ පොළ සඳහා විලාසිතා ඉදිරිපත් ආයතන කරන අභිබවා පරලෝකයටත් විලාසිතා ඉදිරිපත් කරන ආයතනයක් ලෙස සුවිශේෂී අනන්‍යතාවයක් ගොඩ නගා ගැනීමට ඔවුනට හැකිවන බැවිනි. ඒ අනුව 'මෙලොවින් පරලොවට පවා යැවෙන' යන හැඳින්වුම යටතේ තම වෙළෙඳ නාමය ඉදිරිපත් කිරීමට ද ඔවුනට හැකිවනු ඇත.

මගේ නූපන් පුංචි අම්මාට පින් පිණිස සාංඝික දනයක් දීමට මා කළ යෝජනාවේ දී ඇයගේ වේෂයෙන් කළ කතා කළ ශාස්ත්‍රකාරිය කෝපයට පත්වීම ද මා මෙවන් සෑම ස්ථානයකදීම මුහුණ දුන් පොදු තත්ත්වයකි. එමෙන්ම ඊට බලපාන ප්‍රබල හේතුවක් ද තිබේ. එනම් මළවුන් වෙනුවෙන් කරන ආගමික වත් පිළිවෙත් වලින් තම මඩිය තරකර ගැනීමට නොලැබීම ය. ඒ නිසා කවර තොරොට්ටුවක් දමා හෝ ඒ සඳහා වියදම් වන මුදල තමන් වෙතට ඇද ගැනීමට ඔවුහු මාන බලති. මෙහි දී සිද්ද වූයේ ද එම සුලබ සාමාන්‍ය සංසිද්ධිය මිස ඊට අමතර කිසිවක් නොවේ. මෙවා අප පොදු සමාජයේ මෙතෙක් අවධානයට ලක් නොවූ කරුණු අතර වෙයි.
කෙසේ හෝ මෙම සිදුවීමෙන් වසර කිහිපයකට පසු විවිධ රෝගාබාධා වලට මුහුණ දුන් එම ශාස්ත්‍රකාරිය අකල් මරණයකට පත් වූ බව ද මට දැන ගත හැකි විය.